
# රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප

## නෛතික පසුබිම
## හිමිකම
## ප්‍රතිලාභ



විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

# රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප

## නෛතික පසුබිම

## හිමිකම

## ප්‍රතිලාභ


| | | |
|---|---|---|
| කෙටි දුරකථන | ■ | 1970 |
| දුරකථන | ■ | 011- 2209800 |
| ඊමේල් | ■ | info@pensions.gov.lk |
| Web site | ■ | www.pensions.gov.lk |

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.


1-H039145

# විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය

1934 පෙබරවාරි 05 දිනැති විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය (Minutes on pensions) මුලික නෛතික ලියවිල්ල වේ. මෙම විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය අවස්ථා කිහිපයකදීම සංශෝධනය විය.

සිවිල් විශ්‍රාම වැටුප් ක්‍රමය 1901 සිට ක්‍රියාත්මක වේ. 1947 අංක 2 දරන ආඥා පනතේ 2 වගන්තිය මගින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය 1901 සිට ලංකාවේ ලිඛිත නීතියේ කොටසක් බවට පත් කර ඇත.

දැනට ක්‍රියාත්මක වන්නේ 1972 මැයි මස 05 දින නිකුත් වු සංශෝධිත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යි.

# සන්නද්ධ (යුධ, ගුවන්, නාවික) හමුදා විශ්‍රාම වැටුප් සංග්‍රහය

1981 යුධ හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය
1981 නාවික හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය
1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය

## වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ආඥා පනත

1898 දී නීතිගත වු වැන්දඹු හා අනත්දරු අරමුදල් ආඥා පනත තුළ එකී අරමුදල් ක්‍රමයට දායක විය හැක්කේ විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ධාරීන්ට පමණි. ඒ අනුව එම දිනයට පෙර සිට විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක වූ බවට ද සාක්ෂි ඇත. එමෙන්ම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල්/යෝජනා ක්‍රමය ඒකාබද්ධව ක්‍රියාත්මක වූ බව පිළිගත හැක. 1983 දී නීතිගත කරන ලද වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තුළ රාජ්‍ය සේවාවේ නිලධාරිණියන්ට ද එකී විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වීමට අවස්ථාව ලැබුණි.

### අදාළ පනත් (නීතිමය ප්‍රතිපාදන)

රාජ්‍ය සේවාවේ ඒ ඒ ක්ෂේත්‍රයන් වෙනුවෙන් විවිධ අණපනත් ක්‍රියාත්මක වේ.

- සිවිල් හා අධිකරණ නිලධාරීන් හා නිලධාරිණියන් සඳහා වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත්
- සන්නද්ධ හමුදා වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරුවන් සඳහා වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු පනත්
- පළාත් පාලන නිලධාරීන් / නිලධාරිණියන් සඳහා පළාත් පාලන සේවා වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග
- පුද්ගලික පාසල් හා පිරිවෙන් ගුරුවරුන් සඳහා පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත

# වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්

- 1898 අංක 1 දරන වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත, ක්‍රියාත්මක දිනය 1898-06-23
- 1906 අංක 13 දරන ආඥා පනත
- 1981 අංක 44 දරනු (සංශෝධන) පනත, 431 වන අධිකාරිය
- 1998 අංක 57 දරන (සංශෝධන) පනත
- 1998 අංක 64 දරන (සංශෝධන) පනත
- 2010 අංක 8 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත
- අංක 1719/3 හා 2011 අගෝස්තු 15 දින අති විශේෂ ගැසට් නිවේදනය

# වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්

- 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත, ක්‍රියාත්මක දිනය 1983-08-01
- 1985 අංක 19 දරන (සංශෝධන) පනත
- 1997 අංක 16 දරන (සංශෝධන) පනත
- 1998 අංක 56 දරන (සංශෝධන) පනත
- 1998 අංක 65 දරන (සංශෝධන) පනත
- 2001 අංක 02 දරන (සංශෝධන) පනත
- 2010 අංක 9 දරන (සංශෝධන) පනත
- අංක 1719/3 හා 2011 අගෝස්තු 15 දින අති විශේෂ ගැසට් නිවේදනය

# සන්නද්ධ හමුදා වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්

- 1970 අංක 18 දරන වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ හමුදා) පනත හා ඒ යටතේ පනවන ලද 1970.11.28 දිනැති නියෝග මාලාව, ක්‍රියාත්මක වන දිනය 1968.10.11

- 1985 අංක 18 දරන (සංශෝධන) පනත

- 1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු (සන්නද්ධ හමුදා) පනත, ක්‍රියාත්මක දිනය 1983.08.01

- 2009 අංක 29 වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (සන්නද්ධ හමුදා) (සංශෝධන) පනත

# පළාත් පාලන විශ්‍රාම වැටුප්

- 1952 පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග
- 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත
- 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝග
- 1985 අංක 10 දරන (සංශෝධන) පනත
- 1985 පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග
- 1986 පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් නියෝග

# පුද්ගලික පාසල් හා පිරිවෙන් ගුරුවරුන්

- 1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත
- 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත
- 2008 අංක 32 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

# රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

විශ්‍රාම වැටුප් අහිමි රජයේ ඇතැම් නිලධාරීන්ට මූල්‍යමය ප්‍රතිලාභ සැලසීමේ අරමුණින් 1942 අංක 18 දරන ආඥා පනත මගින් 1942.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල පිහිටුවා ඇත. වරින්වර කරන ලද සංශෝධන මගින් මෙම අරමුදලේ සාමාජිකත්ව හැකියාව පුළුල් කර ඇත. 1970.05.30 දක්වා මුදල් අමාත්‍යාංශය යටතේ පැවති මෙම අරමුදල 1970.12.23 දින සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට පවරා ඇත.

අරමුදල කළමණාකරන මණ්ඩලයක් විසින් පාලනය කෙරෙන අතර එහි සංයුතිය පහත දැක්වේ.

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් (සභාපති)
උප නීතිපති, සොලිසිටර් ජනරාල් (සාමාජික)
කම්කරු කොමසාරිස් (සාමාජික)
වාරිමාර්ග අධ්‍යක්ෂ (සාමාජික)
අරමුදලේ සාමාජිකයකු

- 1942 අංක 18 දරන ආඥා පනත
- 2003 අංක 17 දරන (සංශෝධන) පනත

## විශ්‍රාම වැටුප් හිමිකම

රජයේ නිලධාරියකු සම්බන්ධව විශ්‍රාම වැටුපක් හිමි වීම සඳහා පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය.

- ස්ථිර විශ්‍රාම වැටුපක් සහිත පත්වීමක් ලබා තිබීම
- එම තනතුරෙහි සේවය ස්ථිර කර තිබීම
- මාස 120ක දළ සේවා කාලයක් තිබීම (අවම වශයෙන්)
- විධිමත් පරිදි විශ්‍රාම ගන්වා තිබීම

විශේෂිත තනතුරු සඳහා දළ සේවා කාලය පහත දැක්වේ.

- ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ ගරු විනිසුරුවරුන් සඳහා මාස 36ක දළ සේවා කාලය
- මහාධිකරණ විනිසුරුවන් සඳහා අවම මාස 84ක දළ සේවා කාලය
- අධිකරණ නිලධාරීන් මාස 84ක දළ සේවා කාලය
- රාජ්‍ය සේවයේ නොවන අමාත්‍යාංශ ලේකම්වරුන් සඳහා මාස 60ක දළ සේවය
- ගරු අමාත්‍යවරුන්ගේ පෞද්ගලික ලේකම් / සම්බන්ධීකරණ ලේකම් වැනි "ට" උපලේඛන ගත කාර්යය මණ්ඩලය මාස 60ක දළ සේවා කාලය

# විශ්‍රාම වැටුප් හිමිකම

- සිවිල් රාජ්‍ය නිලධාරීන්ට වසර 30ක සේවා කාලයට උපරිම ප්‍රතිශතය හිමි වේ.
- ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, ගරු විනිශ්චයකාරවරුන් සඳහා 90% ක අඩු නොකළ ප්‍රතිශතය හිමි වේ.
- මහාධිකරණ විනිසුරුවරුන් සඳහා වසර 14ක සේවා කාලයට (සිවිල් නිලධාරීන්ට හිමි) උපරිම ප්‍රතිශතය හිමි වේ.
- අනෙකුත් අධිකරණ නිලධාරීන් සඳහා වසර 15ක සේවා කාලයට උපරිම ප්‍රතිශතය හිමි වේ.
- රාජ්‍ය සේවයේ පරිබාහිර ලේකම්වරුන් සඳහා වසර 05ක සේවා කාලයට අවසාන වැටුපෙන් 2/3 ක් හා වසර 8ක සේවා කාලයට අවසාන වැටුපෙන් 85%
- ගරු අමාත්‍යවරුන්ගේ ලේකම්වරුන් සඳහා වසර 05ක සේවයට 1/3ක් ද වසර 15ක සේවයක් සඳහා 2/3ක් ද හිමි වේ.

## විශ්‍රාම ගැන්වීමේ විධිවිධාන

1. වෛකල්පිත විශ්‍රාම ගැන්වීම

වයස අවුරුදු 55 සම්පූර්ණ වීම.
වයස අවුරුදු 55 සිට 60 දක්වා විශ්‍රාම ගැන්වීම.

2. අනිවාර්ය විශ්‍රාම ගැන්වීම

වයස අවුරුදු 60 සම්පූර්ණ වීම.

3. වෛද්‍ය හේතුමත විශ්‍රාම ගැන්වීම

වෛද්‍ය මණ්ඩලයක නිර්දේශය මත තව දුරටත් සේවය කිරීම යෝග්‍ය නොවන විටෙක මෙම විශ්‍රාම ගැන්වීම සිදු කරනු ලැබේ.

4. තනතුර අහෝසි වීම මත විශ්‍රාම ගැන්වීම

දෙපාර්තමේන්තු වසා දැමීම, සේවය හෝ තනතුර අහෝසි වීම මත අදාළ නිලධාරීන් විශ්‍රාම ගැන්වීම සිදු කෙරේ.

5. විනය හේතු මත විශ්‍රාම ගැන්වීම

විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී විනයානුකූලව කටයුතු කෙරෙන බවට සෑහීමට පත්වන විට විනය බලධාරියා විසින් විශ්‍රාම වැටුප් විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා මෙවැනි විශ්‍රාම ගැන්වීම් කරනු ලැබේ.

6. අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගැන්වීම

රාජකාරි ඉටු කිරීම දුර්වල වීම මත විශ්‍රාම ගැන්වීම වේ. විශ්‍රාම වැටුප් හිමිවන්නේ වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙනි.

7. විශ්‍රාම වැටුප අහුරා තිබීම.

විශ්‍රාම වැටුප තාවකාලිකව නතර කොට රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි සේවයට යා හැකිය. එම ආයතනයෙන් විධිමත් පරිදි ඉවත් වූ විට විශ්‍රාම වැටුප ලබා ගත හැකිය.

8. ගුරුවරියන්, හෙදියන් හා පොලිස් කාන්තාවන් විශ්‍රාම ගැන්වීම

වයස අවුරුදු 50 එළඹෙන දිනය හෝ සේවා කාලය වසර 20ක් සම්පූර්ණ වීම යන දෙකෙන් පළමුව එළඹෙන දිනයේ දී වෛද්‍ය සහතිකයකින් තොරව විශ්‍රාම ගැන්වීම.

9. රා.ප.ච 30/88 අනුව විශ්‍රාම ගැන්වීම

සේවය වසර 20ක් සම්පූර්ණ කර ඇති රජයේ නිලධාරීන්ට විශ්‍රාම යාම සඳහා මනාපය පළ කළ හැකිය. විශ්‍රාම වැටුප හෝ පාරිතොෂිකය ලබාගත හැක්කේ වයස අවුරුදු 55 සම්පූර්ණ කළ දිනයේ දීය.

# විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ

රාජ්‍ය නිලධාරීන්ට හිමි සේවා අවසාන ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට අනුකූල විය යුතුය. නියමිත සේවා කාලය අවසානයේ දී විශ්‍රාම පාරිතෝෂිකය හා මාසික විශ්‍රාම වැටුප ලබා ගැනීම, සේවා කාලය තුළ සිදුවන මරණයක දී යැපෙන්නන්ට මරණ පාරිතෝෂිකය ගෙවීම මෙන්ම වෙනත් විවිධ හේතූන් මත පාරිතෝෂික හා වෙනත් දීමනා හිමි ගැන්වීම් ඒ අතර ප්‍රධාන වේ.

1 විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ

- මාසික විශ්‍රාම වැටුප්
  පරිවර්තිත පාරිතෝෂිකයක් ලබා ගත් විට වසර 10ක් සඳහා අඩු කළ මාසික විශ්‍රාම වැටුප ද ඉන් අනතුරුව අඩු නොකළ මාසික විශ්‍රාම වැටුප ගෙවනු ලැබේ.

  පරිවර්තිත පාරිතෝෂිකය ලබා ගැනීමට මනාපය පළ නොකළ විට විශ්‍රාම ගත් දිනයේ සිටම අඩු නොකළ මාසික විශ්‍රාම වැටුප ගෙවනු ලැබේ.

- විශ්‍රාම පාරිතෝෂිකය (පරිවර්තිත පාරිතෝෂිකය )
  අඩු නොකළ මාසික විශ්‍රාම වැටුප මෙන් 24 ගුණයක ප්‍රමාණයක් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ලෙස ලබා ගත හැකි අතර, පුද්ගලයා මිය ගොස් ඇති විට උරුමකරුවන්ට ගෙවනු ලැබේ.

- සේවා පාරිතෝෂිකය
  දළ සේවා කාලය මාස 120ක් සම්පූර්ණ කිරීමට ප්‍රථම විශ්‍රාම යන නිලධාරීන් සඳහා එක් වරක් ගෙවනු ලබන අතර, සේවා කාලයෙන් සම්පූර්ණ කරනු ලබන සෑම මාසයක් සඳහාම මාසික වැටුපෙන් 1/12 ක් ලෙස ගණනය කෙරේ.

- **මරණ පාරිතෝෂිකය**

  ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරක ස්ථිර කරනු ලදුව විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා මාස 60ක අඩු සේවා කාලයක් සහිත නිලධාරීන්ගේ යැපෙන්නන්ට අඩු නොකළ වාර්ෂික විශ්‍රාම වැටුප මෙන් දෙගුණයක් හෝ වාර්ෂික වැටුප හෝ යන මේ දෙකෙන් වැඩි ප්‍රමාණයක් ලැබේ.

- **විශේෂ වන්දි**

  රාජකාරියේ යෙදී සිටිය දී සිදුවන හදිසි ආපදාවන් හේතුවෙන් මිය යන හෝ ආබාධිත තත්ත්වයට පත් වන රජයේ සේවකයන්ට හා එසේ මියයන සේවකයන් වෙනුවෙන් ඔවුන්ගේ යැපෙන්නන්ට උපරිම වසර 10කට සමාන වැටුප, මෙම වන්දි වශයෙන් ලබා ගැනීමට හිමිකම් ඇත.

- **වන්දි විශ්‍රාම වැටුප්**

  රජයේ නිලධාරියකු තම රාජකාරිය සඳහා යන එන අතරතුර හෝ රාජකාරියේ යෙදී සිටියදී සිදුවන අනතුරු වලින් පූර්ණ ආබාධිත වූ විට හෝ අනතුරින් මිය ගිය විට යැපෙන්නන්ට මාසිකව ගෙවනු ලබන විශ්‍රාම වැටුපකි.

- **දෛනික සේවා පාරිතෝෂිකය**

  මාස 120කට වැඩි සේවා කාලයක් සහිත හා විශ්‍රාම වැටුප් රහිත තත්ත්වයක් යටතේ රාජ්‍ය සේවයෙන් ඉවත් වන දෛනික ගෙවීම් ලබන නිලධාරීන් සඳහා එක් වරක් ගෙවනු ලබන අතර, සේවා කාලයෙන් සම්පූර්ණ කරනු ලබන සෑම මාසයක් සඳහාම මාසික වැටුපෙන් 1/12 බැගින් ගණනය කරනු ලැබේ.

- **පුණ්‍යාධාර දීමනාව**

  විශ්‍රාම වැටුපක් අහිමි හා වෙනත් ආදායම් මාර්ගයක් නොමැති අසරණ වූ රජයේ සේවයේ සිටි පුද්ගලයන්ට හෝ යැපෙන්නන්ට මාසිකව කරනු ලබන ගෙවීමකි.

## 2 සන්නද්ධ හමුදා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ

- **සේවා විශ්‍රාම වැටුප්**
  අධිකාරීලත් නිලධාරියකු මාස 240ක සේවා කාලයක් ද අධිකාරී නොලත් නිලධාරියකු මාස 264ක සේවා කාලයක් සපුරා විශ්‍රාම ලැබූ විට සේවා විශ්‍රාම වැටුප් හිමි වේ.

- **පරිවර්තිත පාරිතෝෂිකය**
  අදාළ නිලධාරියා විසින් කැමැත්ත ප්‍රකාශ කළ හොත්, අඩු නොකළ මාසික විශ්‍රාම වැටුප මෙන් 24 ගුණයක ප්‍රමාණයක් ගෙවනු ලැබේ.

- **සේවා පාරිතෝෂිතය**
  විශ්‍රාම වැටුපකට සුදුසුකම් නොලබන එහෙත් වසර 10කට නොඅඩු සේවා කාලයක් සහිත නිත්‍ය හා ස්වේච්ඡා හමුදා නිලධාරීන්ට එක් වරක් ගෙවනු ලැබේ.

- **යැපෙන්නන්ගේ දීමනාව**
  සේවයේ යෙදී සිටිය දී මරණයට පත් වන ත්‍රිවිධ හමුදා නිලධාරීන්/ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට ගෙවනු ලබන මාසික දීමනාවකි.

- **විශේෂ වන්දි**
  අසාමාන්‍ය තත්ත්වයන් හේතුකොට ගෙන මරණයට පත්වන සන්නද්ධ හමුදා නිලධාරීන්ගේ යැපෙන්නන්ට එකවර ගෙවනු ලබන විශේෂ වන්දියකි.

- **මරණ පාරිතෝෂිකය**
  වසර 05කට නොඅඩු සේවා කාලයක් සහිත සහ ඔවුනට පාලනය කර ගත නොහැකි තත්ත්වයක් යටතේ මරණයට පත්වන හමුදා නිලධාරීන්ගේ හෝ නිත්‍ය හමුදා සෙබලුන්ගේ යැපෙන්නන්ට පරිවර්තිත පාරිතෝෂිකය

හෝ වසරක වැටුප යන දෙකෙන් වැඩි ප්‍රමාණයක් ගෙවනු ලැබේ.

- දුබලතා විශ්‍රාම වැටුප්
  හමුදා සේවයේ යෙදී සිටියදී රෝගී තත්ත්වයට පත්වීමෙන් හෝ අනතුරකට භාජනය වීමෙන් දුබලතාවයට පත්වන නිලධාරීන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් මගින් සේවයට නුසුදුසු බැව් තීරණය කර හමුදාපති විසින් නිර්දේශ කර ඇත්නම් ඔහුට දුබලතා විශ්‍රාම වැටුපක් ලබා ගත හැක.

## 3 **වැන්දඹු / වැන්දඹු** පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ

- කලත්‍රයාට වැන්දඹු / වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප
- වයස අවුරුදු 26 දක්වා වන (රැකියා විරහිත) අනත්දරුවන්ට විශ්‍රාම වැටුප
- ආබාධිත අනත්දරුවන්ට ජීවිත කාලයටම විශ්‍රාම වැටුප
- වැන්දඹුව / වැන්දඹු පුරුෂයා යළි විවාහයකට ඇතුළත් වූ විට, විශ්‍රාම වැටුපෙන් 50% ක් ලබා ගැනීම
- මිය ගිය නිලධාරියකු වෙනුවෙන් වයස අවුරුදු 55 දක්වා වැටුප් ගෙවන විට අවසන් වරට ලැබූ වැටුප මත යළිත් මෙම විශ්‍රාම වැටුප සංශෝධනය කෙරේ.

## 4 රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ

- ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලබන විට දායකයාගෙන් අය කළ මුදල (8%) හා පොළිය ලබා ගත හැකි වීම.

- ස්ථිර විශ්‍රාම වැටුප් පත්වීමක් රහිතව සේවය අවසන් කළ විට දායකයාගෙන් අය කළ මුදල (8%), රජයේ දායකත්වය (12%) හා පොළිය ලබා ගත හැකි වීම.

## 5 වෙනත් ප්‍රතිලාභ

- වාර්ෂිකව නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර කට්ටල දෙකක් හිමි වීම
- විශ්‍රාමිකයන් සඳහා වෛද්‍ය රක්ෂණ ප්‍රතිලාභ (යෝජිතය)
- විශ්‍රාමික නිවාඩු නිකේතනය, කැළණිය, වෙදමුල්ල
- විශ්‍රාමික සංගම් ලියාපදිංචි කිරීම සහ ශක්තිමත් කිරීම
- නුවරඑළිය නිවාඩු නිකේතනය (යෝජිතයි)

# විවිධ අණ පනත්හි විශ්‍රාම වැටුප් පිළිබඳ රීති

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය මුලික නීතිය වුවත් විවිධ අණපනත් සම්මත කිරීමේදී කාර්යය මණ්ඩල සුරක්ෂිත භාවය සඳහා විශ්‍රාම වැටුප් පිළිබඳ වගන්ති එකී කෘතින්වල අන්තර්ගත වේ. එවැනි නීති කෘතින් ගණනාවකි.

| | |
|---|---|
| 1953 | අංක 09 දරන පාර්ලිමේන්තු කාර්යය මණ්ඩල පනත |
| 1974 | අංක 16 දරන පළාත් පාලන සේවා පනත |
| 1974 | අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජල පවාහන පනත විශ්‍රාම වැටුප් (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් |
| 1975 | අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත |
| 1978 | අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත |
| 1979 | අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත |
| 1981 | අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජන පනත |
| 1985 | අංක 07 දරන විශ්වවිද්‍යාල ( සංශෝධන) පනත |
| 1987 | අංක 42 දරන පළාත් සභා පනත |
| 1988 | අංක 32 දරන ලංකා විදුලිබල මණ්ඩල (සංශෝධන) පනත |
| 1990 | අංක 36 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (විශේෂ විධිවිධාන) |
| 1993 | අංක දරන පළාත් සභා විශ්‍රාම වැටුප් පනත |
| 1996 | අංක 27 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංදේශ (සංශෝධන) |
| 1996 | අංක 8 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව (විශේෂ විධිවිධාන) |
| 2002 | අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත |
| 2007 | අංක 51 දරන ගම්පහ වික්‍රමආරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල(පැවරීමේ)පනත |

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව